

# පැෆරල් විධායක අධ්‍යක්ෂ

සාලිය කුමාර ගුණසේකර

සෞඛ්‍ය අංශවලින් ලබාදී තිබෙන මාර්ගෝපදේශවලට අනුගත නොවන අයුරින් දේශපාලන රැස්වීම්, ප්‍රචාරක රැලි පවත්වන බවට ලැබෙන පැමිණිලි ඉහළ යමින් පවතින බවත්, සෞඛ්‍ය අංශවලට සම්බන්ධ ඇතැම් දේශපාලනඥයන් පවා කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශ කඩකරමින් දේශපාලන ප්‍රචාරක කටයුතුවල නිරත වන බවත් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වයේ (පැෆ්රල්) විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි පැවසීය. කිසිදු දේශපාලන පක්ෂයක් මේ දක්වා සිය ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති බවද එම සංවිධානය පවසයි.

කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේදී එම සංවිධානය විසින් ඊයේ (15 වැනිදා) පවත්වන ලද මාධ්‍ය හමුවකදී විධායක අධ්‍යක්ෂවරයා මේ බව කීවේය.

තැපැල් ඡන්දයට අදාළව මෙතෙක් බරපතළ ගැටලු කිසිවක් වාර්තා වී නොමැති බවත්, තැපැල් ඡන්ද මධ්‍යස්ථාන දෙකකදී පමණක් ඡන්ද පත්‍රිකාව ඡායාරූපගත කිරීමේ සිද්ධීන් වාර්තා වූ බව පැෆ්රල් සංවිධානය සඳහන් කරයි.

රජයේ ගුවන්විදුලි නාළිකාවක් තැපැල් ඡන්දයට බලපෑමක් වන අයුරින් දේශපාලනඥයන් ගෙන්වා වැඩසටහන් පැවැත්වීම පිළිබඳව පැමිණිල්ලක්ද පැෆ්රල් සංවිධානයට ලැබී ඇත. තැපැල් ඡන්ද මධ්‍යස්ථානවලින් සියයට 98.2 ක කටයුතු සිදු කෙරුණේ සෞඛ්‍ය නිර්දේශවලට අනුකූලව බව විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි කීවේය.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මැතිවරණ කොමිෂන් සභාවට ලබාදුන් පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශ ගැසට් කරන ලෙස සෞඛ්‍ය ඇමැතිවරියට ලිඛිතව දන්වා ඉල්ලීම් කළ බවත්, රටේ සෞඛ්‍ය අවදානම් තත්ත්වයට පත්ව තිබීම තුළ මෙම ගැසට් පත්‍රය නිකුත් කිරීම ප්‍රමාද කිරීම නිසා අවදානම පාලනය කිරීමට බලධාරීන්ට තිබෙන ඉඩ ප්‍රස්ථාව අඩුවන බවද ඔහු සඳහන් කළේය.

නීතිවිරෝධී ප්‍රචාරණ කටයුතු, ඡන්දදායකයන්ට අල්ලස් ලබාදීමට අදාළව වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට එරෙහිවය. එම පැමිණිලි සංඛ්‍යාව 316 කි. සමගි ජන බලවේගයට එරෙහිව පැමිණිලි 129 ක්ද, දෙමළ ජාතික සන්ධානයට එරෙහිව පැමිණිලි 69 ක්ද, එක්සත් ජාතික පක්ෂයට එරෙහිව පැමිණිලි 42 ක්ද, ජාතික ජන බලවේගයට එරෙහිව පැමිණිලි 23 ක්ද පැෆ්රල් සංවිධානයට ලැබී ඇත.

ඇතැම් දේශපාලන පක්ෂවල මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට ඇතැම් රජයේ නිලධාරීන්, විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් සම්බන්ධ බවට පැමිණිලි ලැබී ඇති බැවින්, එම නිලධාරීන් මැතිවරණ රාජකාරිවලට යොදා නොගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයා කීවේය.

ඉකුත් ජූනි මස 14 වැනිදා සිට ඊයේ (15 වැනිදා) දක්වා වූ කාලය තුළදී පැෆරල් සංවිධානයට රාජ්‍ය බලය සහ දේපළ අයුතු ලෙස භාවිත කිරීමේ සිද්ධීන්, රජයේ වාහන මැතිවරණ කටයුතුවලට යොදා ගැනීම ආදී සිද්ධීන් 58 ක් වාර්තා වී ඇත.

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව පැෆරල් සංවිධානය විසින් නිරීක්ෂකයන් 5000කට වැඩි පිරිසක් යොදවා ඇත. තැපැල් ඡන්ද කටයුතු නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයන් 1000ක් යොදවා ඇති බවද එම සංවිධානය පවසයි.